# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 ජූලි මස 19 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2024.07.23 දින නිකුත් කරන ලදී)**

# ජාත්‍යන්තර පාරම්පරික සිංහලවේදය සභාව (ITSC) (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**ජාත්‍යන්තර පාරම්පරික සිංහලවේදය සභාව (ITSC) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 24.00 — තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජාත්‍යන්තර පාරම්පරික සිහෙලවේදය සභාව (ITSC)
# (සංස්ථාගත කිරීමේ)

## ජාත්‍යන්තර පාරම්පරික සිහෙලවේදය සභාව (ITSC) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ජාත්‍යන්තර පාරම්පරික සිහෙලවේදය සභාව" (ITSC) යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සභාවක්, එකී සභාවේ සාමාජිකයින් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී සභාවේ පරමාර්ථ කාර්යක්ෂමව කරගෙන යාමේ සහ ඉහත සඳහන් සභාව හා සම්බන්ධ සියලු කාරණා ඉටු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින්ද; පූර්විකාව

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහාද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සභාව සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින්ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින්ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක        දරන ජාත්‍යන්තර පාරම්පරික සිහෙලවේදය සභාව (ITSC) (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු " සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන) " ජාත්‍යන්තර පාරම්පරික සිහෙලවේදය සභාව (ITSC)" මෙතෙක් සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ මින්මතුවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු " සංස්ථාපිත මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) " ජාත්‍යන්තර පාරම්පරික සිහෙලවේදය සභාව (ITSC)" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, ඒ සංස්ථාපිත මණ්ඩලය විසින්ද, එයට විරුද්ධවද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එය භාවිතා කිරීමට ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. ජාත්‍යන්තර පාරම්පරික සිහෙලවේදය සභාව සංස්ථාගත කිරීම

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා සංස්ථාව ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය හැකි ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය, සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහාද, එම පොදු පරමාර්ථ මතු දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) ජාත්‍යන්තර පාරම්පරික සිංහලවේද ආයතනය (ITSI) නමින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීම;

(ආ) පාරම්පරික සිංහල වෙදකම, සිංහල හෙදකම, සිංහල ගොවිතැන, සිංහල සටන් කලාව, සිංහල ජ්‍යෝතිර්වේදය, සිංහල භූත වෛද විද්‍යාව, සිංහල නර්තනය, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයම නියෝජනය කරන සාමාජිකයන් ලවා ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයම භාවිතා කරමින් සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු ප්‍රජාවන් අතර පාරම්පරික සිංහල වෙදකම ප්‍රචලිත කිරීම;

(ඈ) සුවතා පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරයන්ට (Wellness Eco-Tourism) සහායවීමෙන් ජාත්‍යන්තර සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම මගින් සංචාරකයින්ගේ මානසික කායික සුවතාවය ලබාගැනීමට සහාය වීමෙන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා ගැනීමට ක්‍රියා කිරීම;

(ඉ) සියලුම ලෙඩ රෝග සඳහා නිශ්චිත සිංහලවේද රෝගී සත්කාර ඒකකයක් ක්‍රියාත්මක කිරීම;

(ඊ) විදේශ රටවල සිංහලවේදයේ ශාඛා ස්ථාපනය කිරීම;

(ඞ) විදේශීය විශ්වවිද්‍යාල හා ඒකාබද්ධව අධ්‍යාපනික හා සාමාජීය පාඨමාලාවන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඟ) සිංහල සටන් කලාව දේශීය හා විදේශීය ප්‍රජාවන් අතර ප්‍රචලිත කරවීම තුළින් පොදු රාජ්‍ය මණ්ඩල තරගයක් වශයෙන් ක්‍රීඩාවට එකතු කිරීම;

(එ) ඖෂධ උයන් නිර්මාණය හා සියලු වෙද හෙදකම්වලට අවශ්‍ය සෑම ඖෂධ වර්ගයක්ම භේදයකින් තොරව වගා කිරීමට අවසරය ලබා ගැනීම හා එම ඖෂධ උයන් සමාජගත කිරීම;

(ඒ) සියලුම පාසල් ළමුන්ගේ මානසික ආතතිය දුරුකරවීම, කායික දුර්වලතාවයන් දුරු කිරීම හා බෝ නොවන රෝග විද්‍යාව පිළිබඳව සිංහලවෙදයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඔ) ''වෙදගම'' නමැති පාරම්පරික වෙද ගම්මානයේ කොටසක් ලබාගෙන සිංහලවෙදයේ ක්‍රියාකාරකම් කිරීමට හා ප්‍රධාන වශයෙන් අනුරාධපුරය, මීනුවන්ගොඩ වසා තිබෙන පාසල් සිංහලවෙදයේ ව්‍යාපෘති සඳහා යෙදවීමට අවසර ලබා ගැනීම;

(ඕ) වැඩිහිටි රැකවරණය සඳහා මහලු නිවාස වෙනුවට රැකවරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම හා ආපදා කළමනාකරණය සඳහා සිංහලවෙදයේ යතුරුපැදි කණ්ඩායම යෙදවීම; සහ

(ක) සමාජ ශුභසාධන ආයතනයක් ලෙස සිංහලවෙදය ජන සහන පුණ්‍ය ආයතනය ස්ථාපිත කිරීම.

(2) (1) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේදී, සංස්ථාපිත මණ්ඩලය විසින් ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනත් එවැනි හේතුවක් මත වන යම් වෙනසකින් තොරව එකී පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සිදු කිරීමට වග බලා ගත යුතු ය.

*රජයේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග කිසිදු ගැටුමක් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය විසින් වගබලා ගත යුතු බව*

**4.** සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ, සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සහ රජයේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව කරගෙන යන්නා වූ යම් කාර්යයක් අතර කිසිම ගැටුමක් නිර්මාණය නොවන ආකාරයකින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම*

**5.** (1) මේ පනතේ විධිවිධානවලට, වෙනත් යම් ලිඛිත නීතියකට සහ 7 වගන්තිය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම 7 වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් නිලධරයන් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී කළමනාකරණ සභාවේ ධුර දරන සාමාජිකයින් (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත සහ 7 වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළමුවැනි සභාව පත් කරනු ලබන හෝ තෝරා පත් කරගනු ලබන තෙක් සංස්ථාපිත මණ්ඩලයේ අතුරු සභාවක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) 7 වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන ලෙස සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සහ සංස්ථාපිත මණ්ඩලයේ පළමුවැනි සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම සඳහා රීති සෑදීමේ බලය අතුරු සභාවට ඇත්තේ ය:

එසේ වුවද, 7 වගන්තියේ (2) සහ (3) උපවගන්තිවල විධිවිධාන (1) උපවගන්තිය යටතේ සාදනු ලබන රීති සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(ඇ) අතුරු සභාවේ යම් තීරණයක් යම් රැස්වීමකට පැමිණ සිටින එහි සාමාජිකයන්ගේ බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට වසරක් ඇතුළත පත් කරගනු හෝ තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරු සහ උපදේශකවරුන් ද ඇතුළුව සභාවේ ධුර දරන සෑම නිලධරයකු ම වසර තුනක කාල සීමාවක් සඳහා පත්කර ගනු හෝ තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර, එකී වසර තුනක කාලසීමාව ඉකුත්වීමෙන් පසුව එකී ධුර දරන නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කරගැනීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, අශක්නුතාවයට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයට පහත දැක්වෙන බලතල ඇතුළුව එහි පරමාර්ථ හෝ ඒවායින් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා, අවශ්‍ය හෝ යෝග්‍ය යම් සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය තිබිය යුතු ය:–

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව යෝග්‍ය යැයි සලකනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි ඍජුවම හෝ තත්කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ මුදල් රැස් කිරීම සහ දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින්, මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුවද, සංස්ථාපිත මණ්ඩලයට ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සභාව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතුය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම, සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යනුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ වෙනත් සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම, හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යෑම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ට වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී කාර්ය මණ්ඩලය පුහුණු කිරීම; සහ

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා මේ පනතින් බලය දෙන ලද වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය ලබා දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :–

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම්, නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය හා කාර්ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සහ සභාවේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එකී රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සභාවේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම අවස්ථාවකදීම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ සමාජික නාමලේඛනය

**8.** සභාව විසින්, සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් 6(ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් අනුමත කරනු ලබන බැංකුවක හෝ ඊට වැඩි සංඛ්‍යාවක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනතේ කාර්ය සඳහා ''බැංකුව'' යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ I කොටස යටතේ ''බලපත්‍රලාභී වාණිජ බැංකුවක්'' ලෙස බලපත්‍රලත් බැංකුවක් අදහස් විය යුතුය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබ තිබිය යුතු ය.

**ගිණුම් හා විගණනය**

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සළස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

**වාර්ෂික වාර්තාව**

11. (1) සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් සමඟ ඒ වාර්තාව, සෞඛ්‍යය විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා

සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී, සංස්ථාපිත මණ්ඩලය වෙත විදේශීය හා දේශීය මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) උපවගන්තියේ සඳහන් වාර්තාවට අමුණනු ලැබිය යුතුය.

සභාව විසින් ගෙවිය යුතු සහ සභාවට අයවිය යුතු ණය

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සභාව විසින් ගෙවිය යුතු සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සභාවට අයවිය යුතු සියලු ණය සහ සභාවට ගෙවිය යුතු සියලු සාමාජික සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවනු ලැබිය යුතුය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව

**13.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් එය නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීති වලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

මුදල් සහ දේපළ අදාල කර ගැනීම

**14.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, කවර හෝ ආකාරයකින් ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් සහ දේපළ හුදෙක්ම සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් අදාළ කරගනු ලැබිය යුතු අතර, ඉන් කිසිදු කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් හෝ අන්‍යාකාරයකින් කවර හෝ ලෙස සෘජුව හෝ වක්‍රව ගෙවනු හෝ පවරනු නොලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට

ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිභාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි සභාවේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමක දී ඉතිරිවන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේදී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, එම දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් උචිත ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) උපවගන්තියේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලයේ සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු ඉතිරි වන යම් දේපළක් පවරනු ලැබිය යුතු උචිත ආයතනය 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ඇතිව, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** මේ පනතේ සඳහන් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාවක අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය.

අර්ථ නිරූපණය

**18.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

''සිංහලවේදය'' යන්නෙන්, අනාදිමත් කාලයක සිට සම්භවය ලැබූ මහා ගෝත්‍රයන් වන යක්ඛ, දේව, නාග සහ රාක්ෂ යන සිව් හෙලයේ ගෝත්‍ර හතරට අයත්ව ජීවත්වන විද්‍යාත්මක ක්‍රමවේදයක් මෙන්ම සිව්හෙල හෝ සිහෙල වෙදකම, හෙදකම, ගොවිතැන, සටන් කලාව, නර්තන කලාව, ආහාර සංස්කෘතිය, අධ්‍යාපන සංකල්පය, රූපලාවන්‍ය කලාව, කායික සම්බාහනය හා තෛල අභ්‍යයන්ගය, පාරම්පරික කටු චිකිත්සාව, ලී කැටයම් හා රුක් කලාව, ඖෂධවේදියා ඇතුළත්වන බව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.